# ඔබගේ තැන්පතු සඳහා අදාල රක්ෂණ වන්දි මුදල් ලබා ගැනීම පිළිබඳ උපදෙස්

(1) **ශ්‍රී ලංකා මහ බැංකුවෙන් වන්දි මුදල් ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබන්නේ කුමන තැන්පතුද ?**

තනි පුද්ගලයින්, ව්‍යාපාර ආයතන, සමිති සමාගම් සහ සංවිධාන.

(2) **වන්දි ගෙවීම සඳහා සුදුසුකම් ලබන්නේ කුමන ආකාරයේ තැන්පතුද ?**

සියළුම ආකාරයේ තැන්පතු ගිණුම් හා ස්ථාවර තැන්පතු පැවරීම මගින් ලබා ගන්නා ලද ඡන්ද හිමිනැති කොටස්ය.

(3) **මෙම වන්දි ගෙවීමේ ක්‍රමය යටතේ කොපමණ මුදලක් ගෙවනු ලබයිද ?**

එක් තැන්පත්කරුවෙකුට ගෙවනු ලබන උපරිම මුදල රු.600,000/00

(4) **මෙම වන්දි ගෙවීමේ ක්‍රමය යටතේ තැන්පත්කරුවන්ට පොලියක් ලැබේද?**

2020 ක්වූ මැයි මස 22 වනදින තුරු නොගෙවා ඇති සියලු පොලී මුදල් තැන්පත් මුදලට එකතු කර ඇති අතර, 2020/05/22 දිනෙන් පසු කිසිදු පොලී මුදලක් ගෙවන්නේ නැත.

(5) **කොටස් හිමිකරුවන්ටද වන්දි ගෙවීම අදාල වේද ?**

ඔව්. ඡන්ද බලය අහිමි කොටස් බවට පරිවර්තනය කල තැන්පතු සතු පාරිභෝගිකයින්හට පමණක් වන්දි මුදල් ගෙවනු ලබයි.

(6) **මෙම වන්දි මුදල් ලබාගත හැක්කේ කොතැනින්ද ?**
ඔබට ආසන්නයේම පිහිටි 'මහජන බැංකු' ශාඛාවෙන් ලබාගත හැකිය.

(7) **වන්දි මුදල් ලබා ගැනීම සඳහා මහජන බැංකුව වෙත ඉදිරිපත් කලයුතු ලේඛණ මොනවාද ?**

ස්ථාවර තැන්පතු සහතිකයේ මුල් පිටපත/පාස්පොත/තැන්පත්කරුගේ අනන්‍යතාවය තහවුරු කලහැකි ලියවිලි හා වෙනත් අදාල වන ලියවිලි ආදිය.

(8) **මේවනවිට විදේශගතව සිටින තැන්පත්කරුවන්ට වන්දි ලබාගත හැකිද ?**

ඔව්, එම තැන්පත්කරුවන්ගේ ශ්‍රී ලංකාව තුල පදිංචි පුද්ගලයෙකුට ඇටෝර්නි බලපත්‍රයකින් එම වන්දි මුදල් ලබා ගැනීමට බලය පැවරීම මගින් වන්දි මුදල් ලබාගත හැක.

(9) **රු.600,000/00 ක වන්දි මුදල් ලබා ගැනීමෙන් පසුව ඉතිරි තැන්පතු මුදලක් වේ නම් එම මුදල් තැන්පත්කරුවන් ලබා ගන්නේ කෙසේද ?**

සියළුම තැන්පත්කරුවන්ට වන්දි මුදල් ගෙවීමෙන් පසුව ඒ පිළිබඳව දන්වනු ලැබේ.

(10) **වන්දි මුදල් ලබාගැනීමට අදාලව වැඩිදුරටත් ගැටළුවක් ඇතිවුවහොත් 'ද ෆිනෑන්ස්' ආයතනය සමග සම්බන්ධ විය හැක්කේ කෙසේද?**

අපගේ ක්ෂණික දුරකථන අංක (Hot Line) 0112 597610 වෙත හෝ 'inquiry@thefinance.lk' විද්‍යුත් තැපැල මගින් ඔබට අවශ්‍ය තොරතුරු ලබාගත හැක. කාර්යාල වේලාවන්හි අංක 55, ආර්.ඒ.ද මැල් මාවත, කොළඹ 04 යන ලිපිනයේ පිහිටි ප්‍රධාන කාර්යාලයට පැමිණීමෙන්ද ඔබට අවශ්‍ය තොරතුරු ලබාගත හැක.

(11) **ජාතික හැඳුනුම්පත් අංකයන්, නම් සහ ලිපිනයන් සම්බන්ධ දෝෂයක්, සහතික පත් අස්ථානගතවීම්, පසු අයිතිකරුවන් (Nominee) සහ මුද්‍රා සහිත සහතිකයක්, විකෘති වූ හෝ විනාශ වූ ස්ථාවර තැන්පතු සහතික ආදී ගැටළු නිරාකරනයට ගතහැකි පියවර මොනවාද?**

තැන්පත්කරු හෝ ඔහුගේ නියෝජිතයෙක් තමන් සතු සියලුම විස්තර හා ලියවිලි රැගෙන කාර්යාල වේලාවන් තුලදී 'ද ෆිනෑන්ස්' ආයතනයේ ප්‍රධාන කාර්යාලය වෙත පැමිණිය යුතු වේ.

(12) **මහජන බැංකුව සතු පසු අයිතිකරුවන්ට (Nominee) අදාල විස්තර වැරදි නම් කුමක් කලයුතුද?**

¨ද ෆිනෑන්ස්¨ සමාගමේ ප්‍රධාන කාර්යාලය වෙත ඒ පිළිබඳව දැනුම් දෙන්න. එම විස්තර සපයා ඇත්තේ තැන්පත්කරු විසින් නම් 'ද ෆිනෑන්ස්' ආයතනයේ ප්‍රධාන කාර්යාලයේ නිළධාරීන් විසින් අදාල ශාඛාවෙන්, ඔබගේ තැන්පතු ඉල්ලුම්පත්‍රය ලබාගෙන ඒවා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබා දීමට කටයුතු කරනු ලබන අතර, ඔවුන් විසින් ගෙවීම් කටයුතු සඳහා මහජන බැංකුව වෙත එම විස්තර යොමු කරනු ඇත.